විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (05)
W.A. විමලසේන සර් - 2021. 10. 31
(8.30 – 11.30)

# විෂය මාලාවේ සමාජ ආර්ථික පසුබිම




- සමාජය හා විෂය මාලාව
- ගතික ආර්ථිකය සහ විෂය මාලාව
- වෙනස් වන පවුල් සංස්ථාව සහ විෂය මාලාව
- සංස්කෘතික විවිධත්වය සහ විෂය මාලාව
- විශේෂ ළැදියා කණ්ඩායම් සහ විෂය මාලාව

## සමාජය හා විෂය මාලාව

සමාජය විවිධත්වයට පත් වෙමින් පවතින අතර අ ාාපන ක්‍රමය සමාජයේ ආයතනික ජාලයට සමීපව බැඳී ඇත. එබැවින් ඕනෑම සමාජයක පාසල් අධ්‍යාපනයේ අන්තර්ගතය හැඩගැසී ඇති ආකාරය අවබෝධ කර කරගැනීමට අධ්‍යාපනය හා සමාජයේ අනෙකුත් ආයතන අතර ඇති සබඳතා අවබෝධ කරගත් යුතුය. වෙනත් වචන වලින් කිවහොත් අප උගත් උගන්වන්නේ කෙසේද එය වූ උගන්වන්නෙ ඇයි ද යන්නට තේරුම් ගැනීමට නම් අප විෂය මාලාව සකස් කරන සමාජ බල බලවේග දෙස බැලිය යුතුය. විෂයමාලාව සැලසුම් කිරීමේදී පහත දැක්වෙන ප්‍රශ්න යොමු කළ යුතුය.

1. විෂයමාලාව කෙතරම් දුරට පාසලෙන් පිටත වචනය සල්කා බලයිද
2. සමාජයේ වෙනස්වීම විෂයමාලාවට බලපාන්නෙ කෙසේද

ආදී කරුණු සලකා බැලිය යුතුය. විෂය මාලාව සමාජයේ පදනම දැනගැනීමට පන්තිකාමරවල, පාසල් වල, අදධ්‍යාපනය සිදු වන දේ සමාජ සන්දර්භය තුළ පවතින අතර පාසලේ විෂයමාලාව හැඩගස්වා ගැනීමට එය තීරණය වේ. විෂයමාලාව වර්තමානය හා අනාගතය සඳහා සිසුන් සූදානම් කිරීමක් විය යුතුය.

වෙනත් ලෙසකට කිවහොත් විෂයමාලාවක් ප්‍රාදේශීය ජාතික වශයෙන් සමාජ තත්වයන්ට ්‍රතිචාර දැක්වීමෙන් ඉගෙන ගන්නන්ගේ වශ්‍යතා සපුරාලිය යුතුය.

( මැක් හෝල් - 1995)

විෂය මාලාවක් ඉගෙනගන්නත් හට පැහැදිලිව ගැටළු විසඳීමට හැකි, අභියෝග් වලට මුහුණ දිය හැකි **චින්තන** කුසලතා, නිපුනණතා ඇතුළත් වන පරිදි සැලසුම් කළ යුතුය.

එපමණක්ද නොව විෂය මාලාව තුළින් දිනෙදා ජීවිතය පවත්වා ගෙන යාමේ සාමාන්‍ය දැනුම ( කියවීමල ලිවීම ලගණිතය ආදී විෂයයන් ට වැදගත් වේ). එමෙන්ම විෂය මාලාව ශිෂ්‍යයාගේ නිශ්චිත වර්තමාන තත්වය මෙන්ම අනාගත අවශ්‍යතා සපුරාලිය යුතු බව පැහැදිලි කරයි. මේ ආකාරයට සමාජය හා විෂය මාලාව අතර දැඩි සම්බන්ධතාවයක් පවතින බව පෙනේ.

## ගතික ආර්ථිකය හා විෂය මාලාව

අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යය වන්නේ ජාතියේ ආර්ථිකයට සහභාගී වීමට හැකි වන පරිදි සුදුසු කුසලතා දැනුම් ඇති පුද්ගලයන් බිහි කිරීම බව පෙන්වා දිය හැකිය. පාසලාසල් අධ්‍යාපනයේ ස්වභාවය සමාජයේ පිළිබිඹු කරන අතර උදාහරණ ලෙස නම් වන සියවස් අග භාගයේ එක්සත් ජනපදයේ ජීවිතය ගොවිපල පදනම් කරගත්තක් විය. මෙම ජීවන රටාව පාසලින් පිළිබිඹු විය. කෘෂිකාර්මික සමාජයක අවශ්‍යතා සපුරා සපුරාලීමට පාසලට හැකි වන පරිදි අධ්‍යාපන පරිසරයක් ගොඩනැගීම දහනමවන ව වන සියවස අග භාගයේ ඇමරිකාවේ එම පෙරිකාවේ එම පාසල්වල එම තත්ත්වය නිර්මාණය විය. න්‍යායාත්මක දැනුම මෙන් ම ප්‍රායෝගික කුසලතා ද ලබාදෙමින් කෘෂිකාර්මික සමාජය උචිත මූලික කුසලතා ගැන උනන්දු කළේය. මෙයින් අපේක්ෂා කරන්නේ ආර්ථික රටාවට හුරු අධ්‍යාපනික ක්‍රමයක් සකසා ගැනීමටයි.

20 වන ශත වර්ෂය වන විට කාර්මික විප්ලවය බොහෝ ආර්ථික වෙනස්කම් ඇති කරන ලදී. එහිහි ප්‍රතිඵලයක් ලෙස කාර්මික සමාජයට අවශ්‍ය නව කුසලතාල නිපුනණතාල ලබාදීමට සිදුවේ. එහිදහිදී අධ්‍යාපනයෙ මෙන්ම විෂය මාලාවේ විශාල වෙනස්කම් සිදුවිය. බටහිර රටවල් බොහොමයක් ම කර්මාන්තශාලාවලට උචිත කාර්මික රැකියා සඳහා සුදුසු නිපුනණතාල කුසලතා උගන්වන ලදී. එනම් පාසලක කර්ම කර්මාන්ත කර්මාන්ත ශාලාවක් බවටට පත් කරන ලදී. මින් අදහස් කළේ වෙනස්වන ආර්ථිකයට ගැලපෙන අධ්‍යාපනික රටාවක් ගොඩ නැංවීමයි. එබැවින් විෂයමාලාව රටට අභ්‍යන්තර ආර්ථික ස්වාධීතාව ගැන අවධානය යොමු කරමින් උචිත විෂය මාලාවන් සැලසුම් කළ යුතුය.

(2021 මහ බැංකු වාර්තාවේ - අධ්‍යාපන කොටස බලන්න)

## වෙනස්වන පවුල් සංස්ථාව හා විෂයමාලාව

කෘෂිකාර්මික හෝ පූර්ව කාර්මික සමාජයක ස්ත්‍රී, පුරුෂ භාවය පුද්ගලයන් ගේ භූමිකාව තීරණය කරයි. පිරිමි ළමයි වයසින් වැඩි වූ විට ඔවුන් තම පියා සමඟ වැඩ කළහ. අනෙක් අතට කාන්තාවන් නිවාස නඩත්තු කරමින්, දරුවන් රැක රැකබලා ගනිමින් කටයුතු කළහ. ඔවුන් මැසීම, ආහාර සැකසීම ආදී කාර්යයන් සිදුකළහ. මේ අනුව පිරිමින් කාන්තාවන් හා ළමුන් මුළු පවුලේම දියුණුව වෙනුවෙන් කටයුතු කළහ. පවුල් විශාල වූ අතර දෙමාපියන්, දරුවන් එකිනෙකා සහයෝගීව කටයුතු කළෝය. (විස්තෘත පවුල)

කාර්මික ආර්ථිකයක් වෙත මාරු වීමේ දී පවුල් සංස්ථාවේ වෙනස්කම් ඇතිවිය. දෙමාපියන් තම වැඩිහිටි දරුවන් සහ ඔවුන්ගේ දරුවන් සමග ජීවත් වූ පුළුල් පවුල විශේෂයෙන් පහත වැටුණි. (නාගරික ප්‍රදේශවල) එනම් න්‍යෂ්ටික පවුලක් කරා වෙනස්කම් ඇතිවිය. පවුලේ සාමාජිකයන් ගණන සීමා විය. දෙමාපියන් නිවසින් බැහැරව ආගමික කටයුතු වල නියැලීම නිසා දරුවන් අසීරුතාවයට පත්විය. දරුවන් රැකබලා ගැනීමේ ගැටලු මතුවිය. ඒ නිසාම දරුවන්ගේ කාර්යසාධනය අඩුවිය.

නාගරික ප්‍රදේශ වල පවුල්වල සාරධර්ම සම්බන්ධතා බිඳී ගියේය. සමාජ ආයතන වල ගැටලු මතුවිය. දෙමාපියන් බොහෝ විට ආර්ථික කටයුතු සිදු සිදුකිරීම නිසා දූ දරුවන් සබඳතා බිඳ වැටී ය. මේ නිසාම මානසික ආතතිය, ප්‍රචණ්ඩත්වය, අපරාධ, පවුල් කඩාකප්පල් වීම් ආදිය ඉස්මතු විය. මේ නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වල බරපතල ගැටලු මතුවිය අධ්‍යාපන සාධනයේදී ඊළඟ පරම්පරාවට දැනුම ලබා දීමේ ගැටලු මතුවිය. එමෙන්ම එබඳු පවුල්වල සමාජල ආර්ථික බලපෑම් නිසා දරුවන්ට අධ්‍යාපනයය ලබාගැනීමේ බරපතළ ගැටෙලු මතුවිය. මේ නිසා විෂයමාලාව සම්පාදනයේදී හා ඉගැන්වීමේදී මෙබඳු ගණයේ දරුවන් උදෙසා මූලික අවධානය යොමු කළ යුතු බව පැහැදිලි වේ.

## සංස්කෘතික විවිධත්වය හා විෂමාලාව

සමාජය විවිධත්වයට පත්වෙමින් පවතී. විශේෂයෙන් නාගරික ප්‍රදේශවල සමාජයන්හි බහු සංස්කෘතික හා බහු ආගමික ස්වරූප ගනී. විෂයමාලාව එම් වෙනස්කම් අවබෝධ කර කරගැනීමට වැදගත් වෙයි. වර්තමානය වන විට ලෝකය විශ්ව ගම්මානයක් කරා, නව වටිනාකම්, නව භාෂා, නව ජීවන රටා සහිත සමාජයක් බවට පත් වෙමින් පවතී. විවිධ සංස්කෘතීන්ගෙන් සමන්විත සමාජයන් දක්නට ලැබේ. මෙම සංස්කෘතික විවිධත්වය තුළින් විෂය මාලාව යොදා ගැනීම අධ්‍යාපනයේ අභියෝගයක් වී ඇත. මෙය විටෙක දේශපාලනයික වශයෙන් ද මතු වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස විවිධ ජනවාර්ගික, සංස්කෘතික, ආගමික කණ්ඩායම් ඒකාබද්ධ කිරීම් සුදුසු බව පෙන්වා දෙයි. විවිධ සංස්කෘතීන්, භාෂා, ආගම් ආදියේ අනන්‍යතාවය තබා ගනිමින් ම විෂයමාලාව එම කාර්යය නැතහොත් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය විෂය මාලාව තුල අධ්‍යාපනය මගින් සිදුවිය යුතු බව පැහැදිලි කරයි.

විෂය මාලාව විවිධ සංස්කෘතීන්ට ආමන්ත්‍රණය කරයි. විෂය මාලාව මගින් සිසුන්ට විවිධ සමාජ හා සංස්කෘතික වටිනාකම් වලට ප්‍රතිකාර දැක්වීමට හා සංවර්ධනය කිරීමට හැකියාව ඇත. එපමණක් ද නොව මූලික සාරධර්ම භාවිතය මත පදනම් වූ ජාතික අනන්‍යතාවයක් නිර්මාණය කිරීමට හැකියාව ඇත.

විෂයමාලාව මේ ආකාරයට ශිෂ්‍යයා පෝෂණය කරමින් වටිනාකම් තහවුරු කරමින් සිදු කිරීමටට හැකියාව ඇත.

| |
|---|
| පැවරුම<br><br>විෂයමාලාව කෙරෙහි සංස්කෘතික ආර්ථික සමාජ බලපෑම් පිළිබඳව කරුණු දහයක් ලියන්න |

## විශේෂ ලැදියා කණ්ඩායම් හා විෂය මාලාව අතර සම්බන්ධය

විවිධ විශේෂ උනන්දුවක් දක්වන සමාජ කණ්ඩායම්, පුද්ගලයන් සඳහා පාසල් විෂය මාලාව මගින් කිසියම් පෙළඹවීමක් ඇතුළත් කළ යුතුයි. එබැවින් විෂය මාලාව සඳහා, ඒ සඳහා කළ යුතු දේ කරුණු දක්වීමට උත්සාහ කරයි. ඒ අනුව පහත දක්වෙන ලැදියා කණ්ඩායම් සඳහා පාසල් විෂය මාලාවේ අදාලත්වය අවධාරණය කරයි. ඒ අනුව ලැදියා කණ්ඩායම් මෙසේය,

- පරිසර ගවේෂණ කණ්ඩායම්
- මත්ද්‍රව්‍ය නිවාරණ කණ්ඩායම්
- පාරිභෝගික උපදේශක කණ්ඩායම් (පාරිභෝගික උපදේශක සංවිධාන)
- සෞඛ්‍ය කණ්ඩායම් ( AIDS නිවාරණ වැඩසටහන් )
- ලිංගික අධ්‍යාපනය දැනුවත් කිරීම සම්බන්ධ කණ්ඩායම් (අනවශ්‍ය ගැබ් ගැනීම් වැළැක්වීම, අපචාර ආදිය පිළිබඳව තරුණයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නංවන සංවිධාන)
- අපරාධ වැළැක්වීමේ කණ්ඩායම්
- මානව හිමිකම් ආරක්ෂා කිරීමේ කණ්ඩායම්

- පරිසර ගවේෂණ කණ්ඩායම් (පරිසර සංවිධාන)

පරිසර සංවිධාන පිළිබඳව අවධාරණය කරන විට සිසුන්ගේ **පරිසර සංරක්ෂණය, ගවේෂණයට ඉඩකඩ දීම, පරිසරයට ආදරය කිරීම** වැනි සාරධර්ම ඉගැන්විය යුතු බව විෂය මාලාවෙන් අවධාරණය කරයි. **වායු දූෂණය, කාර්මික දූෂණය, ගංගා රැකබලා ගැනීම්** වැනි කාර්යන් වල නියැලීමට සාරධර්ම අධ්‍යාපනයක් විෂයමාලාව මගින් ලබා දිය යුතුය.

* මත්ද්‍රව්‍ය නිවාරණ කණ්ඩායම් (මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීමේ සංවිධාන)

මත්පැන්, සිගරට් යනාදී අනිසි භාවිතයන් පිළිබඳව සිසුන් දැනුවත් කිරීම පාසල් විෂය මාලාවට ඇතුළත් කළ යුතු වේ. මත්ද්‍රව්‍යවල ඇබ්බැහි වීමේ පල විපාක පිළිබඳව සිසුන්ට අවධාරණය කිරීමේ පාසල් වැඩපිළිවෙළ තුළ විෂයමාලා ක්‍රියාකාරකම් එහිදී ඉතා වැදගත් වේ. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම සඳහා සිසුන් සදහා ගන්නා ක්‍රියාමාර්ග විෂය මාලාවේ විෂයක් ලෙස ඇතුළත් කිරීම මෙහිදී වැදගත් වේ. (පාසල් විෂය මාලාවේ විෂය භාහිර ක්‍රියාකාරකම් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව ලබා ගනී)

* සෞඛ්‍ය කණ්ඩායම්

HIV දැනුවත් කිරීමේ වැඩසටහන්, පෝෂණ වැඩසටහන්, සෞඛ්‍ය ගැටලු යනාදී කරුණුද සිසන්ට ඉගැන්විය යුතුය. එහිදී ඔවුන්ගේ අභිරුචීන්ට අනුව සෞඛ්‍ය කණ්ඩායම්වල වැඩ කිරීමට අවස්ථාව පාසල මඟින් නිර්මාණය කර දිය යුතුය. එය විෂය මාලාවටද එකතු කිරීම ඉතා යෝග්‍ය වේ.